# සමරු කලාපය

2018

# ස්වප්නජානී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උළෙළ

mass.comm
DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# සෞඛ්‍ය සන්නිවේදනය, සංස්කෘතිය සහ චර්යා වෙනස්කම්

මහාචාර්ය මාපා තිලකරත්න

සෞඛ්‍ය සන්නිවේදනය යනු විශාල ජන කොටසකගේ සෞඛ්‍ය පුරුදු ක්‍රමානුකූල ව ධනාත්මක කිරීම සඳහා යොදා ගන්නා වූ සන්නිවේදන ක්‍රියාවලියකි. ඔවුනගේ සෞඛ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් වැඩි වර්ධනය කිරීම සහ ඒවා උසස් සෞඛ්‍ය තත්ත්වයන් බවට හැරවීම මෙම සෞඛ්‍ය සන්නිවේදන ක්‍රියාවලියෙහි ප්‍රාථමික අරමුණයි. එසේ වුව ද මෙම ක්ෂේත්‍රයෙහි කාර්යයෙහි නියැලී සිටින බොහෝ වෘත්තිකයින් මෙය සත්‍ය වශයෙන් ම ක්‍රියාත්මක කිරීමේ දී සෞඛ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය සන්නිවේදනය, සෞඛ්‍ය ප්‍රවර්ධනය, තොරතුරු අධ්‍යාපන සහ සන්නිවේදනය යනාදී අංශවල නියමයන් සම්බන්ධයෙන් යම් වෙනස් කිරීම් සිදු කිරීම නිසා යම් පැටලිලි ස්වභාවයක් හටගෙන ඇත. මෙම පොත මගින් ඒවායෙහි ඇති නියමයන් වෙනස් කිරීමක් සිදු නොකෙරේ. මෙහි දී අපි පාවිච්චි කරන සන්නිවේදකයා යන වචනයෙන් හඳුන්වන පුද්ගලයා මෙම විෂය ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පුහුණුවක් ලත් කෙනෙකු ලෙස නොසැලකේ. එනමුත් යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීම සඳහා වන මෙම සන්නිවේදන වැඩසටහනට ඕනෑම මහජන සෞඛ්‍ය වෘත්තිකයෙකු හට සම්බන්ධ වී වැඩ කළ හැකි ය.

ඵලදායි සෞඛ්‍ය සන්නිවේදනය යනු කලාවේ සහ විද්‍යාවෙහි සම්මිශ්‍රණයකි. එසේ වුව ද ලැබූ සාර්ථකත්වය හේතු වූ කාරණා අතර ප්‍රධාන කාරණාවක් වන්නේ මහජන සෞඛ්‍ය ප්‍රශ්නවලට පිළියම් වශයෙන් විද්‍යාත්මක සහ සෞඛ්‍ය සන්නිවේදන විධික්‍රමයන් ක්‍රමානුකූලව භාවිතා කිරීමයි. එනමුත් සෞඛ්‍ය සන්නිවේදනයේ වර්ධනයට උපකාර වන නියම සන්නිවේදන උපායමාර්ගයන් සිත් ඇදගන්නා සුලු ය. ඒවා රටකින් රටකට වෙනස් ය. මේ සඳහා ක්‍රියාවේ යොදවන විධික්‍රමයන් ද සමාන ය. එනමුදු එක් එක් රටවල සංස්කෘතික සබඳතා සහ ඕනෑඑපාකම් සැබෑ වශයෙන් ම පරාවර්තනය වන පරිදි සන්නිවේදන වැඩසටහන් සම්පාදනය කිරීම දුෂ්කර ය.

සෞඛ්‍ය සන්නිවේදකයින් සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විකල්ප සවන්දීමකට හා පර්යේෂණ කිරීමට සහ ඒ අනුව පියවර ගැනීමට එකඟ විය යුතු ය. සන්නිවේදකයා සමාජය හරහා කතිකාවකට

අවතීර්ණ වෙමින් ඉලක්කගත පිරිසක් නියෝජිතයින් සමග ක්‍රමානුකූල ව පර්යේෂණයක් සිදු කරයි. සමූහ අවශ්‍යතා මත පදනම් වූ සන්නිවේදන උපායමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාකාරකම්, සංස්කෘතික සම්බන්ධතා සහ පුහුණුවීම් ආදි අදාළ ඇගයීම් අවශ්‍යතාවන් සඳහා පළමුව අපි සමූහයට සවන්දිය යුතු ය. උපායමාර්ග නියැදි සහ අනෙකුත් ද්‍රව්‍ය ජන සමූහය වෙත මහ පරිමාණයෙන් බෙදා හැරීමට පෙර අප විසින් ඒවා මනාව පරීක්ෂා කළ යුතු ය. නිශ්චිත කාලසීමාවක් තුළ සමූහයා වෙත අපගේ අවධානය යොමුකරමින් සවන් දෙමින් නිරීක්ෂණය කිරීමෙන් සහ එම පදනම මත සමූහයේ සාමාජිකයින්ගේ ප්‍රතික්‍රියා, වෙනස්කම් මෙන්ම අවශ්‍ය සන්නිවේදන උපායමාර්ග සහ ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද විමසා බැලිය යුතු ය. මෙම පර්යේෂණ සංයුතිය සහ එහි ප්‍රතිචාරය "සේවාලාභියා රියදුරු අසුනට දැමීම" වන අතර එය විශේෂයෙන 'ම සේවාලාභියාගේ අවශ්‍යතාවන්ට වගකියන සන්නිවේදන උපායමාර්ග සැදීමක් ද වන්නේ ය. ඒ සඳහා සන්නිවේදන විධික්‍රම පියවර පහක් ඇතුළත් ය. තුලනය, සැලසුම්, පෙර පරීක්ෂාව, බෙදා හැරීම සහ මෙහෙයවීම යනාදියයි.

මෙලෙස සෞඛ්‍ය සන්නිවේදනය වෙත අවතීර්ණ වීමේදී එනම් සාමාජීය අලෙවිකරණය, මානව විද්‍යාව, චර්යා විශ්ලේෂණය, ප්‍රචාරය කිරීම, සන්නිවේදනය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාජ විද්‍යාවන් ඇතුළු විවිධ ශික්ෂාවන් මගින් සෞඛ්‍ය සන්නිවේදනය උත්පාදනය වන බව පෙනී යයි. මෙම ශික්ෂාවෙන් එකිනෙකා ඌනපූරණය කෙරෙමින් පොදු මූලධර්ම සහ ශිල්පක්‍රම බෙදා ගැනේ. සන්නිවේදන විධිවිද්‍යාවට මෙම සෑම ශික්ෂාවක්ම විශිෂ්ට දායකත්වයක් ලබාදේ. මෙහිදී විධිවිද්‍යාව තුළ මානව විද්‍යාව, සමාජීය අලෙවිකරණය චර්යා විශ්ලේෂණය මතු වී පෙනේ. සැලසුම්කරුවාට මානව විද්‍යාව සහය වෙයි. (සෞඛ්‍ය අමාත්‍යංශය, රාජ්‍ය නොවන සංස්ථා, සාමූහික කණ්ඩායම්) ජනතාවගේ සංස්කෘතික ලක්ෂණ ඇතුළු විශ්වාස සහ චර්යාවන් ගැළපෙන ඔවුන්ගේ භාෂාවට හා වටිනාකම්වලට අනුරූප වැඩසටහන් ඉලක්කගත සමූහය වෙත ඉදිරිපත් කළ යුතු ය. සෞඛ්‍ය පුහුණුව හා අදාළ ආම්පන්න වර්ධනය කිරීමට නිර්මාණාත්මක සංවර්ධිත උපායමාර්ග ක්‍රියාවලියක් සාමාජීය අලෙවිකරණය මගින් සෞඛ්‍ය සන්නිවේදනයට දක්වන දායකත්වය පිළිබඳවයි.

**භාවිත චර්යා ධර්ම විශ්ලේෂණ :- මිථ්‍යාව සහ යථාර්ථය**

චර්යා ධර්ම විශ්ලේෂණය යනු චර්යා ධර්මවිද්‍යාව තුළ සුවිශේෂී සමාජ චර්යාවන් පර්යේෂණාත්මක ව විශ්ලේෂණය කරන සංවර්ධනය කිරීම හා වෙනස් කර යළි නිෂ්පාදනය කිරීමට යොදා ගන්නා ප්‍රායෝගික ක්‍රියාවලියකි. තවද චර්යා ධර්ම විශ්ලේෂණය ශික්ෂාවක් ද වන අතර චර්යා ධර්ම සහ (පුද්ගලාන්තර සහ ශාරීරික) පරිසරය අතර සම්බන්ධතාවය නවීකරණය කිරීම යනාදියත් එකිනෙකා අතර වැඩි වශයෙන් ක්‍රියාත්මක කළ හැකි නව චර්යාධර්ම ප්‍රතිගහනය කිරීමත් අදහස් කෙරේ.

සෞඛ්‍ය සන්නිවේදනයට අදාළ වන චර්යාධර්ම විශ්ලේෂණ සඳහා භාවිතා කළ හැකි මූලධර්ම සතරක් මෙහි දැක්වේ.

1. බොහෝ චර්යා රටාවන් පිළිබඳව උගත හැක්කේ සංස්කෘතික, සමාජ ආර්ථික සහ පුද්ගලික රටාවන් හඳුන්වා දීම, තනි තනි වශයෙන් නව සෞඛ්‍ය පුරුදු ප්‍රතිග්‍රහනය කිරීමට උගත හැකි අතර දැනට භාවිත වන දේ වඩාත් බලසහිත කිරීම.
2. සාමාජීය හා භෞතික පරිසරය තුළ සිදුවීම් සහ ප්‍රතිචාරයන් (පූර්වගත සහ ප්‍රතිවිපාක) මගින් චර්යාවන් ඇතුළු ව සෞඛ්‍ය ආශ්‍රිත ව චර්යාවන් හැඩගැස්වීම, මෙහි තත්ත්වයෙන් වෙනස් වීම මගින් ද පුද්ගල චර්යාවන් වෙනස් විය හැකිය. මෙතෙක් ලද ප්‍රතිවිපාක ප්‍රයෝජනයට ගනිමින්

ජනතාව වඩා යහපත් සෞඛ්‍ය පරිසරයකට තල්ලු කිරිමට සන්නිවේදන උපායමාර්ග උපකාරි වන අතර කාලෝචිත පුහුණුකිරීම් තුළින් පෙර පුරුදු වෙනස්කිරිම කළ යුතුය. තනි තනි වශයෙන් මෙන්ම සංවිධානාත්මක ව ද යහපත් පරිසරයක් ගොඩනැගිමෙන් සෞඛ්‍ය පුහුණුකිරිම්වලට සහය දැක්විය හැකිය.

3. චර්යා ධර්ම පාලනය හැදෑරීමට අවශ්‍ය කරන තරම් වැඩි කාලයක් නව චර්යාවන් පිළිබඳ ව පාරිසරික තත්ත්වයන් හැදෑරිමට අනවශ්‍ය ය. අපේක්ෂිත සමූහයකට හඳුන්වා දීමට සහ ඉගැන්වීමට සැලසුම් කෙරෙන නව චර්යාවන් පිළිබඳ වැඩසටහන් සෞඛ්‍ය ප්‍රගුණ කිරිම්වලට ආදේශ කළ හැකි දිගු කාලින පැවැත්මක් සහිත සංවර්ධනය කළ විවිධ උපායමාර්ගවලින් සමන්විත විය යුතු ය.

4. රාජ්‍ය තුළ පවතින දැනුම හා විශ්වාසය පිළිබඳව අනුමාන වශයෙන් දැනගත හැක්කේ එහි ජනතාව කරන දෑ හෝ කියන දෑ නිරීක්ෂණය කිරීමෙන් පමණි. අපේක්ෂිත චර්යා වෙනසක් සිදු කළ හැකි සන්නිවේදන වැඩසටහන් ඍජුවම එල්ල විය යුත්තේ එම චර්යාවන් මතට විය යුතු අතර සාමාජික සහ භෞතික පරිසරයේ (නිරීක්ෂණ අවස්ථා) සහය ද ලැබිය යුතු ය. දැනුම සහ ගතිපැවතුම්වල වෙනස්කම් සිත්ගන්නා සුලු නමුදු ඔවුන් චර්යා ධර්ම වෙනසක් සඳහා යෝජනා කළ හැකි මට්ටමේ ප්‍රාථමික යාන්ත්‍රණයක් නොවේ.

ළමා ජීවිත සඳහා වන සෞඛ්‍ය සන්නිවේදනයේ දී අප භාවිතා කරන චර්යා විශ්ලේෂණ පළමුව අපේක්ෂිත චර්යාවන්ට යොමුවීමට සහය වන අතර ඍජු ප්‍රමාණවත් ප්‍රතිඵල ලැබිමට හැකි උපායමාර්ග සැලසුම් කළ යුතු ය. එමගින් යෝජනා කරන්නේ සෞඛ්‍ය සන්නිවේදන විධික්‍රමාවලියේ ඇති සියලු ම වහා සිදු කළ යුතු බලපෑම් කළහැකි ප්‍රායෝගික පියවර සියල්ල ගැනිමයි. සෞඛ්‍ය සන්නිවේදනය මගින් ඇසට පෙනෙන චර්යාවන් වෙත ළගාවෙද්දී විභාග කිරීම සඳහා අපට ලබාදෙන මුලික දෙය වන්නේ සෞඛ්‍ය චර්යාවන් සහ ඒවායෙහි පෙර සිදුවීම් සහ පසු සිදුවීම්වල සමීප සම්බන්ධතාවයි. සංකීර්ණ සෞඛ්‍ය ක්‍රියාමාර්ග දෙස සූක්ෂ්ම දර්ශකයකින් බැලූවිට ඔවුන් සමාජ හා සංස්කෘතික පරිසරයට කෙරෙන බලපෑම හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම අපි වඩාත් ම අවබෝධ කර ගත යුත්තේ කුමන පරිසරයන්හිදී චර්යාවන් ගැළපෙන සෞඛ්‍ය සහ සමාජ ක්‍රියාවලියක් හඳුනාගත යුතු ය.

චර්යා ධර්ම විශ්ලේෂණ සම්බන්ධයෙන් බොහෝ දුර්මත සහ ඒකාකෘතින් තිබේ. සමහර මිනිසුන් විශ්වාස කරන්නේ එය ප්‍රජාතාන්ත්‍රික විරෝධී යාන්ත්‍රික පිවිසුමක් හැටියටයි. එය වැඩසටහනක් තනි තනි වශයෙන් මෙහෙයවීමෙන් යෝජිතව නිර්මාණය වන්නකි. චර්යා විශ්ලේෂකයා සියලු රහස්‍ය දෑ මහජනතාවට දැන ගැනිමට පත් නොකිරිමට වගබලා ගනී. කෙසේ වුවද මෙය විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයින් වන සහ නොවන අයගේ නිර්දේශයන් මත ගොඩනැගුනු මූලධර්ම සහ තාක්ෂණයෙන් සැදුනකි. ගතවූ වසර 12ක පමණ කාලයක් රටවල් 20කට වැඩි සෞඛ්‍ය වෘත්තිකයින් සහ වැඩසටහන් අධ්‍යක්ෂවරුන්ගේ සිට සායනික කම්කරුවන් දක්වා පිරිසක් සෞඛ්‍ය සන්නිවේදන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය මෙම මුලධර්ම ඉතා මැනවින් හදාරා ඇති අතර ඔවුන් රටවල ජනතාවට සෞඛ්‍යානුකුල ජිවිතයක් ගතකිරිමට සහය වෙමින් සිටී.

චර්යා විශ්ලේෂණ ක්‍රමය තවත් අය විශ්වාස කරන්නේ ඉතා සරල හා ලසු දෙයක් ලෙසයි. මක්නිසාදයත් ප්‍රාථමික වශයෙන් කෙරෙන නිරීක්ෂණයන් සහ තනි තනි වශයෙන් චර්යාවන් මැනීමයි. බැලු බැල්මට එහි ඇති මානසික ක්‍රියාවලියට සහ සමාජ සහ සංස්කෘතික බලපෑමයි. එකිනෙකාගේ චර්යා රටාවන් ගැන චර්යා විශ්ලේෂකයාගේ අවධානයට යොමු වන අතර පුළුල් පාරිසරික විසඳුම් අන්තර්ගත කරයි. සංස්කෘතික බලපෑම්, සාමාජික ප්‍රතිමාන සහ සාමාජික වෙළෙඳපොළ සහ මානවවේදයේ මූලධර්ම හා තාක්‍ෂණික විධි සහය වන අතර සාමාජිය සහ සංස්කෘතික බලපෑම් සහ හැසිරීම් සැලසුම් කරමින් සහ පාලනය කරමින් සන්නිවේදකයා සන්නිවේදන වැඩසටහන ක්‍රියාත්මක කරයි.

අපේ අත්දැකීම් අනුව ජනතාව දැනුවත් ව හෝ නොදැනුවත් ව ඒකාකෘතින් නොසලකා හැරීම හා ඔවුන් කිසිම න්‍යාත්මක සන්නිවේදන සහ චර්යාවන් ගැන නොදැන සිටීම චර්යා විශ්ලේෂකයාගේ එදිනෙදා වැඩවලට පහසු ය. මානවවේදය හෝ සාමාජික වෙළෙඳපොළෙහි වෘත්තිකයින් සෘජුවම චර්යා විශ්ලේෂණය අගය කරයි. සෞඛ්‍ය සන්නිවේදන අත්දැකීම්වලට අනුව චර්යා විශ්ලේෂකයින් සහ අනෙකුත් ක්ෂේත්‍රවල වෘත්තිකයින්ගේ සහයෝගයෙන් මෙම අන්තර් ක්ෂේත්‍ර කෝවෙහි බලපෑම මත එය පිරිපහදු කිරීම සිදුවිය යුතු ය.

**සාරාංශය**

සෞඛ්‍ය සන්නිවේදනයට දරුවන්ගේ චර්යා රටා වෙනස් කිරීමට අදාළ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කළ හැකි ය. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ රෝග පාලනය හා ප්‍රතිසංස්කරණයට අදාළව විවිධ සංස්කෘතික ක්‍රියාකාරකම් සිදු කළ හැකිය. චර්යා විශ්ලේෂකයා මේ සඳහා අවශ්‍ය ආම්පන්න සහ ක්‍රමවේදයන් නව චර්යා සහ තාක්‍ෂණය මගින් හඳුන්වා දෙයි. නව ධනාත්මක චර්යාධර්ම වෙනස් කිරීම ගැන සාර්ථක අත්දැකීම් තුළින් පැවසෙන්නේ ධනාත්මක සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාමට චර්යා විශ්ලේෂකයාගේ සන්නිවේදන සංවර්ධන ක්‍රමෝපායන් ඉතා වැදගත් වන බවයි. අනාගත සෞඛ්‍ය සන්නිවේදන වැඩසටහන් මගින් තවදුරටත් චර්යාධර්ම ආශ්‍රිත උපායමාර්ග වැඩදායක ලෙස පවත්වාගෙන යාම කෙරෙහි සිය අවධානය යොමු කෙරෙනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. Communication for the Health and behavior change.Judith A Graeff, John P. Elder, Elizabeth mills Broth, Jossey – Bass Publishers, San Francisco – 1984
2. Marketing health behavior, Principles, Techniques and applications, New York: Pleaum - 1984